*ගෙවීමේ ක්‍රමය.* - වෙන්දේසිය අවසන් වූ වහාම උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතු යි. චෙක්පත් භාරගනු නොලැබේ.

(1) ගැණුම් මිලෙන් සියයට දහයක් (10%),
(2) ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එකයි (1%),
(3) වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකණුම් මුදලින් සියයට දෙකයි දශම පහයි (2.5),
(4) විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තුව රු. 2,000,
(5) ලිපිකරු හා සෝෂක වේතනය රු. 500,
(6) වෙන්දේසිය සඳහන් වැය කරන ලද සියලුම ප්‍රචාරක වියදම් ගැණුම් මිලෙන් ඉතිරි සියයට අනුව (90%) විකිණීමේ දින සිට දන 30ක් තුළ දී හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත ගෙවිය යුතු ය. දින 30ක් තුළ දී ඉතිරි මුදල නොගෙවුවහොත් ගෙවා ඇති සියයට දහයකට (10%) මුදල ආපසු නොගෙවන අතර, දේපළ නැවත වෙන්දේසියේ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු හා අදාළ ලේඛන පරීක්ෂා කිරීමට සහ වැඩි විස්තර සඳහා

එල්. බී. සේනානායක,
සාම විනිසුරු, බලයලත් ජ්‍යෙෂ්ඨ වෙන්දේසිකරු,
තක්සේරුකරු, සහ උසාවි කොමසාරිස්.

අංක 99, උසාවිය පාර, කොළඹ 12
දුරකථන අංක : 011-3144520, දුරකථන/ෆැක්ස් අංකය 011-2445393.

ජ්‍යෙෂ්ඨ කළමනාකරු (ණය අයකිරීම්),
හැටන් නැෂනල් පීඑල්සී,
අංක 479, ටී. බී. ජයා මාවත,
කොළඹ 10.
දුරකථන අංක 011- 2664664.

02- 112

---

## ලංකා බැංකුව

ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 22 වැනි වගන්තිය යටතේ විකිණීම පිළිබඳ දැන්වීම

දොළහමුණ වත්ත, හෙට්ටිපොලෙහි පදිංචි ලංකා හලුගේ නීල් රෝහණ ප්‍රනාන්දු මහතා විසින් උකස් කරන ලද දේපළ
ණය යොමු අංකය : 47/2004, 116/2005, 58/2007

ලංකා බැංකු ආඥාපනතේ 19 වැනි වගන්තිය යටතේ ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරනු ලැබ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2009.11.06 දිනැති අංක 1627 දරන ගැසට් පත්‍රයේ හා 2009.10.26 දිනැති ඩේලිනිවුස් , දිනමිණ හා තිනකරන් යන පුවත්පත් වල පළ කරන ලද යෝජනාවකට අනුකූලව එකී ආඥාපනතේ අංක 26 දරන වගන්තිය යටතේ අයකර ගත හැකි මුල් මුදලේ ශේෂය ද, විකිණීම කෙරෙන දිනය තෙක් ඒ මත අයවිය යුතු පොලිය ද, ගාස්තු හා මුදල් ද, අයකර ගැනීම පිණිස මෙහි පහත උපලේඛනයේ විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍ර පිහිටි ස්ථානයේ දී ම 2011.02.18 වැනි දින පෙ. ව. 10.30 ට අංක 4 ඩී, රඳගුරු මාවත, හලාවතහි පදිංචි වෙන්දේසිකාර ඩී. එල්. ජේ. නිශ්ශංක මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිමු.

### උපලේඛනය

1. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ දේවමැදිහත්පත්තුවේ දොලහමුණ අංක 1337 දරන ග්‍රාමසේවා නිලධාරි කොට්ඨාසයේ සහ පඬුවස්නුවර හෙට්ටිපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ , ගිරාතලාන කෝරලේ, දොලහමුණ ග්‍රාමයේ පිහිටි දෙමටගහ වැටිය නමැති බෙදූ ඉඩම් කැබැල්ල උතුරට : පුහුඹු ඔය අමුණ ද, නැගෙනහිරට : කරත්ත පාර ද, දකුණට : නීල් රෝහණගේ පුද්ගලික ඉඩම ද, බස්නාහිරට : සුජිත් ජයසිංහ සහ කරුණාරත්න උරුමකම් කියන ඉඩම ද, මායිම්ව අංක 1723 දරන ග්‍රාම සැලැස්මෙහි සහ දොලහමුණ ක්ෂේත්‍ර කඩදාසියේ ලොට් 16

හි කොටසක් ලෙස නිරූපනය කර ඇති අතර, රූඩ් එකයි පර්චස් අටක (අ. 0 රූ. 1 පර්. 08) බිම් ප්‍රමාණයකින් යුක්ත වේ. මෙය කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඞී/412/7196/96 යටතේ ලියාපදිංචි කර ඇත.

මෙය මෑතකදී කරන ලද මැනීමකට අනුව පහත ආකාරයට නිරූපනය කර ඇත.

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ දේවමැදි හත්පත්තුවේ දොලහමුණ අංක 1337 දරන ග්‍රාමසේවා නිලධාරී කොට්ඨාසයේ පඩුවස්නුවර - හෙට්ටිපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ගිරාතලාන කෝරලේ දොලහමුණ පිහිටි දෙමටගහ වැටිය නමැති බෙදූ ඉඩම් කැබැල්ල, උතුරට : කරුණාරත්න සහ වෙනත් අය උරුමකම් කියන ඉඩම සහ පුහුඹු ඔය දක්වා ගම්සභා පාරද, නැගෙනහිරට කරත්ත පාර සහ ඩබ්. එම්. කුලරත්න උරුමකම් කියන ඉඩමද, දකුණට : නීල් රෝහණගේ පෞද්ගලික ඉඩම ද, බස්නාහිරට : සුජිත් ජයසිංහ සහ කරුණාරත්න සහ වෙනත් අය උරුමකම් කියන ඉඩම ද, මායිම්ව බලයලත් මිනින්දෝරු එච්. ඒ. එම්. සී. බණ්ඩාර විසින් සාදන ලද 1997 මැයි 12 දිනැති අංක 1798 දරන පිඹුරෙහි ලොට් 1 ලෙස නිරූපනය කර ඇති අතර, රූඩ් එකයි පර්චස් අටක (අ. 0 රූ. 1 පර්. 08) බිම් ප්‍රමාණයකින් යුක්තව එහි ඇති ගහකොළ ගොඩනැගිලි සහ වෙනත් සියලු දේ ද වේ.

2. වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ දේවමැදි හත්පත්තුවේ පඩුවස්නුවර-හෙට්ටිපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සහ අංක 1337 දරන දොලහමුණ ග්‍රාමසේවා නිලධාරී කොට්ඨාසයේ ගිරාතලාන කෝරලේ දොලහමුණ ග්‍රාමයේ පිහිටි දෙමටගහ වැටිය නමැති බෙදූ ඉඩම් කැබැල්ල උතුරට : කරත්ත පාර ද, නැගෙනහිරට : ඩබ්. එම්. සුසිලාවතීගේ රජයේ ඉඩම ද, දකුණට : ඩබ්. එම්. සුසිලාවතීගේ රජයේ ඉඩම ද, බස්නාහිරට : වෙලුන් සිඤ්ඤෝගේ ඉඩම ද, මායිම්ව පර්චස් පහලොවක (අ. 0 රූ. 0 පර්. 15) බිම් ප්‍රමාණයකින් යුක්ත වේ. මෙය අංක 1723 දරන ග්‍රාම සැලැස්මෙහි හා දොලහමුණ ක්ෂේත්‍ර කඩදාසියෙහි ලොට් 16 හි කොටසක් ලෙස නිරූපනය කර ඇති අතර, මෙය කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඞී/412/3586/96 යටතේ ලියාපදිංචි කර ඇත.

මෙය මෑතක දී මැනීමකට අනුව පහත ආකාරයට නිරූපනය කර ඇත :-

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ දේවමැදි හත්පත්තුවේ පඩුවස්නුවර හෙට්ටිපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සහ අංක 1337 දරන දොලහමුණ ග්‍රාමසේවා නිලධාරී කොට්ඨාසයේ ගිරාතලාන කෝරලේ, දොලහමුණ ග්‍රාමයේ පිහිටි දෙමටගහ වැටිය නමැති බෙදූ ඉඩම් කැබැල්ල උතුරට : පුහුඹු ඔය දක්වා වූ ගම්සභා පාරද, නැගෙනහිරට: අංක 1798 දරන පිඹුරෙහි ලොට් අංක 01 ද, දකුණට : නීල් රෝහණ ප්‍රනාන්දු උරුමකම් කියන ඉඩම ද, බස්නාහිරට : සුජිත් ජයසිංහ උරුමකම් කියන ඉඩම ද, මායිම්ව පර්චස් පහලොවක (අ. 0 රූ. 0 පර්. 15) බිම් ප්‍රමාණයකින් යුක්ත වේ. මෙය බලයලත් මිනින්දෝරු ඉරන්දතිස්ස කොටඹගේ විසින් සාදන ලද 2004 ජනවාරි 01 දිනැති අංක 6798 දරන පිඹුරෙහි ලොට් 01 ලෙස නිරූපනය කර ඇති අතර, එහි ඇති ගහකොළ ගොඩනැගිලි සහ සියලු දේ ද වේ.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඒ. එම්. යූ. අත්තනපොල මහතා,
කළමනාකාරු.

ලංකා බැංකුව,
හෙට්ටිපොල.

02-105

HNB 23 -10

## හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - හලාවත ශාඛාව
## (කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශෙෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

හලාවත ප්‍රසිද්ධ නොතාරිස් එම්. ඒ. එස්. මැදගොඩ විසින් සහතික කරන ලද්දා වූ ද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී නමට ලියන ලද්දාවූ ද 2007.05.28 වැනි දින අංක 7890 දරන බැඳුම්කරය යටතේ අය විය යුතු මුදල් ගෙවීම මිහිඳුකුලසූරිය අශෝක් තුෂාර ප්‍රසන්න පෙරේරා යන අය ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් හැටන් නැෂනල් බැන්ක් පී එල් සී විසින් මා වෙත පවරා ඇති බලතල අනුව අයවිය යුතු ණය මුදල් සියලු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුළුව සියලුම මුදල් අයකර ගැනීම පිණිස පහත සඳහන් දේපළ එම දේපළ පිහිටි ස්ථානයේ දී 2011 ක්වූ පෙබරවාරි මස 23 වැනි දින පෙ. ව. 10.00 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපල* .- වයඹ පළාතේ පුත්තලම දිස්ත්‍රික්කයේ හලාවත ඉඩම් ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයේ උතුරු පිටිගල් කෝරළේ අනයිවිලුන්දන් පත්තුවේ රාජකදලුව ගමේ පිහිටි ෆෙලෝරස් එස්ටේට් නමැති ඉඩමට බලයලත් මානක එම්. පී. ෂෙල්ටන් සමරතුංග විසින් ලියා සහතික කරන ලද 1987.04.04 දිනැති අංක 2743 දරන පිඹුරේ ප්‍රකාර බෙදා වෙන් කරන ලද ලොට් 101 ලෙස ලකුණු කර ඇති ඉඩම් කොටස වේ.

බලයලත් මානක එම්. පී. ෂෙල්ටන් විසින් මැන සාදන ලද පිඹුරු අංක 2743/04 - 1997 හි ලොට් අංක 111 (අඩි 20ක් පළල පාර සහ ලොට් අංක 103 හි (අඩි 15ක් පළල පාර) පෙන්වා ඇති මාර්ග අයිතිය ද සමග වේ. විශාලත්වය රූඩ් 1

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2009.12.24 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* හා 2010.01.13 දින අයිලන්ඩ්, දිවයින සහ තිනකරන් පුවත් පත් බලන්න.

*ඉඩමට පිවිසීම*.- හලාවත නගරයේ සිට පුත්තලම ප්‍රධාන පාරේ, කි. මී. 10ක් පමණ ගිය පසු හමුවන කි. මී. 84 කණුව ද, පසුකොට මීටර් 200ක් පමණ ගිය තැන දකුණු පැත්තේ ඇති රණවිරු මාවතේ (ගුරු පාරේ) තවදුරටත් මීටර් 150ක් පමණ ගිය පසු එම පාරට මුහුණ ලා දකුණු පැත්තේ මෙම දේපළ හමුවේ.

*ගෙවීමේ ක්‍රමය.* - වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතු ය.

(1) ගැණුම් මුදලින් සියයට දහයක් (10%) ද,
(2) ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එකක් (1%) ද,
(3) වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මුදලින් සියයට දෙකයි දශම පහක් (2.5%) ද,
(4) විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදාහක් (රු. 2,000) ද,
(5) ලිපිකරු සහ සෝෂක ගාස්තු රුපියල් පන්සියයක් (රු. 500) ද,
(6) සියලුම ප්‍රචාරක වියදම් ද වේ.

ගැණුම් මුදලින් ඉතිරි සියයට අනූවක් (90%) වූ මුදල විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙත ගෙවිය යුතු ය. දින 30ක් ඇතුළත ඉතිරි මුදල නොගෙවුවහොත් ගෙවා ඇති

සියයට දහයක (10%) මුදල අහිමි කිරීමට සහ දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාල ඔප්පු හා ලියවිලි පරීක්ෂාව සහ වෙනත් තොරතුරු ජ්‍යෙෂ්ඨ කළමනාකරු (ණය අධීක්ෂණ සහ අය කිරීම්) හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී, අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10 (දුරකථන අංකය 2661826, 2661835 ගෙන් ලබාගත හැක.

පියරත්න මුතුකුමාරණ,
(මුළු දිවයිනටම සාම විනිසුරු)
උසාවි කොමසාරිස්, තක්සේරුකරු,
හා බලයලත් වෙන්දේසිකරු.

අංක 156 - 1/13,
උසාවිය පාර,
කොළඹ 12.
දුරකථන අංක 0777- 378441
0714 - 424478
ෆැක්ස් අංකය : 0114 - 617059.

02-66

---

SEY 04 -10

**සෙලාන් බැංකුව පීඑල්සී - කළුතර ශාඛාව**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශෙෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

ඌව පළාතේ මොණරාගල දිස්ත්‍රික්කයේ බුත්තල කොරළේ වැල්ලවාය කොට්ඨාසයේ තණමල්විල ප්‍රාදේශීය මහ ලේකම් කොට්ඨාසයේ කතරගම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ කතරගම ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. ජී. ඩී. යූ. කරුණාරත්න විසින් සාදන ලද 2000.02.09 දිනැති අංක 5432 දරන සැලැස්මේ සඳහන් කතරගම කැලේ නමැති රජයේ ඉඩමේ ලොට් අංක 2 ලෙස ලකුණු කළ (බලයලත් මිනින්දෝරු සී. එස්. ජයවර්ධන විසින් සාදන ලද 1991.10.14 දිනැති අංක 2634 දරන සැලැස්මේ සඳහන් ලොට් 2 හි නැවත මැනීමක් වන) රූඩ් දෙකයි පර්චස් දශම බිංදුවයි දෙකක් (අ. 0 රූ. 2 පර්. 0.02) විශාල ඉඩම සහ එහි පිහිටි වෙනත් සියලු දේත් වේ.

පෙර කී අංක 2634 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන පාර සඳහා වෙන් කිරීම පාවිච්චි කිරීමේ අයිතිය සමගය.

ඉහත සඳහන් ඉඩම පහත සවිස්තරව විස්තර කරනු ලබන ඉඩමේ නැවත මැනීමක් වේ. ඌව පළාතේ මොණරාගල දිස්ත්‍රික්කයේ බුත්තල කෝරළේ, වැල්ලවාය කොට්ඨාසයේ තණමල්විල ප්‍රාදේශීය මහ ලේකම් කොට්ඨාසයේ කතරගම ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ කතරගම ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු සී. එස්. ජයවර්ධන විසින් සාදන ලද 1991.10.14 දිනැති අංක 2634 දරන සැලැස්මේ සඳහන් කතරගම කැලේ නමැති රජයේ ඉඩමේ ලොට් අංක 2 ලකුණු කළ එෆ්. වී. එස්. 25 දරන සැලැස්මේ සඳහන් ලොට් අංක 846 හි (නැවත මැනීමක් සහ අතුරු බෙදීමක් වන) රූඩ් 2යි පර්චස් 0.02ක් විශාල ඉඩම සහ එහි පිහිටි සියලු දේත් වේ. (මෙය මොණරාගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් 28/241 හි ලියාපදිංචි කර ඇත. )

මෙම දේපළ කළුතර පිහිටි රියෝ ඉන්ඩස්ට්‍රීස් (පුද්ගලික) සමාගම සහ කළුතර පදිංචි ගුණපාල කතලුවගේ යන අය බන්ධනදායී වශයෙන් සෙලාන් බැන්ක් පීඑල්සී විසින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

ඉහත සඳහන් දේපළ වර්ෂ 2011 ක් පෙබරවාරි මස 25 වැනි දින ප. ව. 3.30 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

ප්‍රවේශය : කතරගම සිට සෙල්ල කතරගම පාරේ මීටර් 200ක් පමණ ගමන් කොට හමුවන කි. මී. 3 කණුව එපිටින් වම් අත පැත්තේ ඇති මෙම දේපළ හමුවේ.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2010.03.18 වැනි දින ඩේලි මිරර් සහ ලංකාදීප පුවත් පත් ද 2010.03.24 දිනැති තිනක්කුරල් පුවත්පත ද 2010.03.19 දිනැති ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය ද බලන්න.

ගෙවීමේ ක්‍රමය. - වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතු ය.

(1) ගැණුම් මුදලින් සියයට දහය (10%)ක් ද, (2) පළාත් අධිකාරියට ගෙවිය යුතු ගැණුම් මිලෙන් සියයට එකක් (1%) ක් ද, (3) වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මුදලින් සියයට දෙකයි දශම පහ (2.5%) ක් ද, (4) විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදාහක් ද (රු. 2,000), (5) ලිපිකරු සහ සෝෂක ගාස්තු රුපියල් පන්සියයක් ද, (රු. 500) (6) සියලුම ප්‍රචාරක වියදම් ද වේ.

ගැණුම් මුදලින් ඉතිරි සියට අනූවක් (90%) වූ මුදල විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත සෙලාන් බැංකුව පී. එල්. සී. වෙත ගෙවිය යුතු ය.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (නීති) සෙලාන් බැංකුව පී. එල්. සී. අංක 90, ගාලු පාර, කොළඹ 03. (දුරකථන අංකය 011- 2456285, 2456284.)

පියරත්න මුතුකුමාරණ,
(මුළු දිවයිනටම සාම විනිසුරු)
උසාවි කොමසාරිස්, තක්සේරුකරු හා බලයලත් වෙන්දේසිකරු.

අංක 156 - 1/13,
උසාවිය පාර,
කොළඹ 12.
දුරකථන අංක: 0777- 378441
0714 - 424478
ෆැක්ස් අංකය : 0114 - 617059.

02-65

---

**හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - හම්බන්තොට ශාඛාව**
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ පවත්වනු ලබන වටිනා දේපලක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. ආර්. ද සිල්වා විසින් සහතික කරන ලද්දා වූ ද, හැටන් නැෂනල් බැංකුව පීඑල්සී නමට ලියන ලද්දා වූ ද 2003.07.15 දිනැති සහ අංක 937 දරන බැඳුම්කරයන් යටතේ (පහත පළවන

උපලේඛනයේ සඳහන් පරිදි) අයවිය යුතු මුදල් ගෙවීම් කොඩිමරක්කල වසන්ත සුකුමාර ප්‍රනාන්දු යන අය ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින්, හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී මා වෙත පවරා ඇති බලතල අනුව අයවිය යුතු ණය මුදල් සියලු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරුගේ ගාස්තුව ඇතුළත්ව සියලුම මුදල් අයකර ගැනීම පිණිස පහත සඳහන් දේපල වර්ෂ 2011 ක් වූ පෙබරවාරි මස 22 වැනි දින පෙ.ව. 10.30 ට සහ ප.ව. 12.30 ට ඇරඹෙන පරිදි දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ හේවාගම් කෝරළේ පල්ලේ පත්තුවේ, කඩුවෙල ප්‍රාදේශීය සභා සීමාවේ බත්තරමුල්ල කොටසේ තලංගම කුරුඳුවත්ත පාරේ වරිපනම් අංක 54/22 හි බතලදෙණියකැලේ නොහොත් ගොරකගහදෙණියකැලේ නමැති ඉඩමට බලයලත් මානක පී. මුණසිංහ විසින් ලියා සහතික කරන ලද 1983 පෙබරවාරි මස ජූලි මස 16 වැනි දින සහ අංක 169 දරන පිඹුරේ ලොට් අංක 169 දරන ඉඩම විශාලත්වය ප්‍රමාණයෙන් පර්චස් විසි හතයි දශම පහයි (අ. 0, රූ. 0, පර්. 27.5) කි බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ හේවාගම් කෝරළේ පල්ලේ පත්තුවේ කඩුවෙල ප්‍රාදේශීය සභා සීමාවේ මාලඹේ ඇටහෙරලියගහවත්ත නොහොත් කොරගහවත්ත නමැති ඉඩමට බලයලත් මානක නලින් හේරත් විසින් මැන සාදන ලද 2004.10.18 දින සහ 2004.03.31 දින දරන පිඹුරේ ලොට් අංක 07 දරන පිඹුරේ ලොට් අංක 07 දරන ඉඩම් කොටස ප්‍රමාණයෙන් පර්චස් දහය (අ. 0, රූ. 0, පර්. 10) කි.

වැඩි දුර විස්තර සඳහා.- 2010.01.22 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* හා 2010.01.25 වැනි දිවයින, අයිලන්ඩ්. හා තිනකරන්, පුවත්පත් බලන්න.

*දේපලට පිවිසීම.*- බත්තරමුල්ල හන්දියේ සිට පන්නිපිටිය පාරට ගමන්කර කිලෝමීටර් 2 1/2 ක් පමණ ගිය පසු(තලවතුගොඩ හන්දියට ළඟාවීමට කිලෝමීටර් 350 කට පෙර) කුමාරගේ වත්ත හන්දිය දක්වා, පසුව වම්පස ඇති තාර පාරට පිවිස (කුමාරගේ වත්ත යනුවෙන් හඳුන්වනු ලබන තාර දමන ලද පාරට පිවිස) මීටර් 300 පමණ ගිය පසු අවසානයේ දී දකුණට හැරී අඩි 12ත් පළල බොරලු පාරට පිවිස මීටර් 20 ක් ගමන් කළ පසු අදාල දේපල දකුණු පස පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.*- වෙන්දේසිය අවසන් වනවාත් සමගම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් මුදලින් සිදු කළ යුතු අතර, චෙක්පත් භාරගනු නොලැබේ :-

1. වෙන්දේසිය තීන්දු වූ විගස ගැණුම් මිළෙන් 10% ක මුදලක්ද,
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක බදු මුදලද,
3. ගැණුම් මිලෙන් 2 1/2% ක් වූ වෙන්දේසිකරුගේ කොමිස් මුදලද,
4. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු 2,000,
5. ලිපිකරු හා සෝෂකගේ ගාස්තුව රු. 1,000,
6. ප්‍රචාරක වියදම් ද,

ගැණුම් මිලෙන් ඉතිරි සියයට අනූවක් (90%) විකිණීමේ දින සිට දින 30ක් ඇතුලත හැටන් නැෂනල් බැංකුව පීඑල්සී ආයතනයට ගෙවිය යුතු අතර, එසේ ගෙවීමට අපොහොසත් වුවහොත් ඒ වන විට ගෙවා ඇති සියයට දහයක් (10%) මුදල් ආපසු නොගෙවීමට ද එම දේපල නැවත වෙන්දේසියේ විකිණීමට ද බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු අදාල ලේඛණ පරීක්ෂාකර බැලීමට හා වැඩි විස්තර දැන ගැනීම සඳහා ජ්‍යෙෂ්ඨ කළමණාකාර (ණය අයකරගැනීම්) හැටන් නැෂනල් බැංකුව පීඑල්සී, අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

දුරකථන අංකය : 011-2664664.

ශ්‍රියානි මනම්පේරි,
ප්‍රසිද්ධ වෙන්දේසිකරු, උසාවියේ කොමසාරිස්,
තක්සේරුකරු සහ බ්‍රෝකර්.

දුරකථන අංකය : 011-2336479 හෝ 0713-151356
අංක 09, බෙල්මන්ට් වීදිය,
කොළඹ 12.

02-125

---

**ඩීඑෆ්සීසී බැංකුව**

1990 අංක 04 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශෙෂ විධිවිධාන) පනතෙහි 9 වැනි වගන්තිය යටතේ වටිනා දේපළ සහ යන්ත්‍රෝපකරණ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

විකුණුම 1

**අංක 13748 දරන උකස්කරය යටතේ උකස් කරන ලද දේපළ පිළිබඳ විස්තර**

1. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, දේවමැදි හත්පත්තුවේ, වල්ගම්පත්තු කෝරළේ, මහකෙලිය ග්‍රාමයේ පිහිටි කන්දෙවත්ත ලෙස හැඳින්වෙන, බලයලත් මිනින්දෝරු එච්. එම්. එස්. හේරත් විසින් සාදන ලද 2005 දෙසැම්බර් මස 08 වන දිනැති අංක 3808 A දරන පිඹුරේ ලොට් අංක 03 ලෙස දැක්වෙන සීමා නිර්ණය කර බෙදා වෙන් කරන ලද බිම් කට්ටිය

ඉඩමේ ප්‍රමාණය අක් 0 රූඩ් 03 පර්. 20

එහි පිහිටි හා ඊට අයත් ගස්වැල්, වගාවන් සහ සියල්ල සහිතවද ඉහත කී පිඹුරේ ලොට් අංක 04 හි දැක්වෙන මාර්ගය භාවිතා කිරීමේ නඩත්තු කිරීමේ අයිති ද සහිතව

2. ඉහත කී මහකෙලිය ග්‍රාමයේ පිහිටි කන්දෙවත්ත ලෙස හැඳින්වෙන, බලයලත් මිනින්දෝරු එච්. එම්. එස්. හේරත් විසින් සාදන ලද 2005 දෙසැම්බර් මස 08 වන දිනැති අංක 3808 A දරන පිඹුරේ ලොට් අංක 02 ලෙස දැක්වෙන සීමා නිර්ණය කර බෙදා වෙන් කරන ලද බිම් කට්ටිය

ඉඩමේ ප්‍රමාණය අක් 01 රූඩ් 03 පර්. 0

එහි පිහිටි හා ඊට අයත් ගස්වැල්, වගාවන් සහ සියල්ල සහිතවද ඉහත කී පිඹුරේ ලොට් අංක 04 හි දැක්වෙන මාර්ගය භාවිතා කිරීමේ නඩත්තු කිරීමේ අයිතිය ද සහිතව

*විකුණුම 2*

**අංක 3370 දරන උකස්කරය යටතේ උකස් කරන ලද දේපල පිළිබඳ විස්තර**

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, දේවමැදි හත්පත්තුවේ, වල්ගම්පත්තු කෝරළේ, මහකෙලිය ග්‍රාමයේ පිහිටි කන්දෙවත්ත ලෙස

හැඳින්වෙන, බලයලත් මිනින්දෝරු ඒ. අතපත්තු විසින් සාදන ලද 2005 ඔක්තෝබර් මස 03 වැනි දිනැති අංක 156/2005 දරන පිඹුරේ ලොට් අංක 01 ලෙස දැක්වෙන බිම් කට්ටිය

ඉඩමේ ප්‍රමාණය : අක් 04 රූඩ් 0 පර්. 0

එහි පිහිටි ගස්වැල්, වගාවන් සහ සියල්ල සහිතව

*විකුණුම 3*

**අංක 3371 දරන උකස්කරය යටතේ උකස් කරන ලද දේපල පිළිබඳ විස්තර**

1. පහත විස්තර කෙරෙන සියලු නිශ්චල හා චංචල පිරියත හා උපකරණ

| *විස්තරය* | *ප්‍රමාණය* |
|---|---|
| ලේත් මැෂින් (වර්ගය - අයිවකී) අනුක්‍රමික අංකය 7A 1000 | 01 |

මාස්පොත දැනට ඇති සියලුම අමතර කොටස් හා උපාංග ඇතුළුව ඊට අයත් වෙනත් සියලු ගබඩා හා ගුදම්වල ඇති සියලුම දෑ

**අංක 13749 දරන උකස්කරය යටතේ උකස් කරන ලද දේපළ පිළිබඳ විස්තර**

2. පහත විස්තර කෙරෙන සියලු නිශ්චල හා චංචල පිරියත හා උපකරණ

| *විස්තරය* | *ප්‍රමාණය* |
|---|---|
| ෂේපින් මැෂින් (වර්ගය ජී අයිසාවා ෂියර්ස්) | 01 |

මාස්පොත දැනට ඇති සියලුම අමතර කොටස් හා උපාංග ඇතුළුව ඊට අයත් වෙනත් සියලු ගබඩා හා ගුදම්වල ඇති සියළුම දෑ

**අංක 14775 දරන උකස්කරය යටතේ උකස් කරන ලද දේපල පිළිබඳ විස්තර**

3. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, දේවමැදි හත්පත්තුවේ, වල්ගම්පත්තු කෝරළේ, කෙලිමුණේ පිහිටි අම්බලන්පිටියේහේන හෙවත් බොරළුවෙලහේන ලෙස හැඳින්වෙන, බලයලත් මිනින්දෝරු පී. බී. දිසානායක විසින් සාදන ලද 2007 ඔක්තෝබර් මස 30 වන දිනැති අංක 4984 දරන පිඹුරේ ලොට් අංක 01 ලෙස දැක්වෙන බිම් කට්ටිය.

ඉඩමේ ප්‍රමාණය : අක් 01 රූඩ් 03 පර්. 0

එහි පිහිටි සහ ඊට අයත් සියළු ගොඩනැගිලි, වගාවන් සහ සියල්ල සහිතව, කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් ටි. එස්. අයි. වැත්තෑව විසින් සහතික කරන ලද, 2006 මාර්තු මස 03 වැනි දිනැති අංක 3370 සහ 3371, කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් එස්. බී. වඳුරගල විසින් සහතික කරන ලද, 2006 නොවැම්බර් මස 29 වැනි දිනැති අංක 13748 සහ 13749 සහ කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් එස්. බී. වඳුරගල විසින් සහතික කරන ලද, 2008 අප්‍රේල් මස 23 වැනි දිනැති අංක 14775 දරන උකස්කරයන් ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ හා 1938 අංක 51 දරන සමාගම් ආඥා පනත යටතේ නීතිගතවූ සමාගම් ලියාපදිංචි අංක N (PVS) 28696 දරන සහ එහි ලියාපදිංචි කාර්යාලය මාස්පොත පිහිටි ස්පෙක්ට්‍රා ඉන්ඩස්ට්‍රීස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් ඩීඑෆ්සීසී බැංකුවට උකස් කරන ලදුව, ගෙවීම්වල දී පොරොන්දු නිසියාකාරව ඉෂ්ට නොකරන ලද දේපල ඩීඑෆ්සීසී බැංකුව විසින් අප වෙත පවරන ලද බලය යටතේ අප විසින් 2011 පෙබරවාරි මස 24 වැනි දින (බ්‍රහස්පතින්දා) (පිළිවෙලින්) පෙ.ව. 11.00 ට, පෙ.ව. 11.45 සහ ප.ව. 1.00 ට පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*ගෙවීමේ ක්‍රමය.-* මිල තින්දු වූ වහා ම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතු ය.

1. ගැණුම් මිලෙන් 10% ක් (සියයට දහයක්),
2. ගැණුම් මිලෙන් 12% ක් වැට් බදු (සියයට දොලහක්),
3. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු,
4. වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2% (සියයට දෙකහමාර),
5. රු. 43,000 ක් වන සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
6. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 500,
7. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2000.

ගැණුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පණවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අය බදු හෝ ගාස්තු අය කිරීම් ද, වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත ගෙවිය යුතු වේ.

වැඩි විස්තර සඳහා කරුණාකර ඩීඑෆ්සීසී බැංකුවේ නීති දෙපාර්තමේන්තුව අමතන්න : දුරකථන අංක 011-2442442

ෂොක්මන් සහ සමරවික්‍රම,
රජයේ අනුමැතිය ලත්, සියවසකට අධික
කලක් ශ්‍රී ලංකාවේ පිළිගත්, පුරෝගාමී
වරලත් වෙන්දේසිකරුවෝ, තක්සේරුකරුවෝ
සහ දේපළ ඒජන්තවරු

*ප්‍රධාන කාර්යාලය,*
අංක 24, ටොරින්ටන් පාර,
මහනුවර,
දුරකථනය 081-2227593
දුරකථන/ෆැක්ස් 081-2224371
ඊමේල් :schokmankandy@sltnet.lk

*නගර කාර්යාලය හා ප්‍රදර්ශනාගාරය,*
290, හැව්ලොක් පාර,
කොළඹ 05,
දුරකථන 011-2502680 011-2585408
දුරකථන/ෆැක්ස් 011-2588176
ඊමේල් :schokman@samera1892.com
වෙබ් අඩවිය :www.schokmanandsamerawickreme.com

02-80

---

**සීමාසහිත එම් සී බී බැංකුව**

1990 අංක 04 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙහි 9 වැනි වගන්තිය යටතේ වටිනා දේපලක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහ නගර සභා සීමාව තුළ, පිටකොටුව ඩෑම් වීදියේ, කලින් අංක 09, ඩෑම් වීදිය ලෙස පැවැති, වර්තමානයේ අංක 09 සහ 9 - 1/1 ඩෑම් වීදියේ පිහිටි, බලයලත් මිනින්දෝරු ඊ. එම්. ඇන්තනීස් විසින් සකසන ලද 1942 ජනවාරි මස 20 වැනි දිනැති අංක 3777 දරන පිඹුරේ ලොට් අංක B ලෙස දැක්වෙන සීමා නිර්ණය කර බෙදා වෙන් කරන ලද බිම් කට්ටිය සහ එහි පිහිටි ගොඩනැගිල්ල,

ඉඩමේ ප්‍රමාණය : අක් 0 රූඩ්. 0 පර්. 11 10/100

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, කොළඹ මහ නගර සභා පරිපාලනයට අයත් කොට්ඨාස අංක 19, කොච්චිකඩේ දකුණ ඩැම් වීදියේ, අංක 09 ඩැම් වීදිය යන ලිපිනය දරන, බලයලත් මිනින්දෝරු කේ. සෙල්වරත්නම් විසින් සකසන ලද 2002 ජූලි මස 24 වන දිනැති අංක 9807 දරන පිඹුරේ ලොට් අංක B ලෙස දැක්වෙන සීමා නිර්ණය කර බෙදා වෙන් කරන ලද බිම් කට්ටිය සහ එහි පිහිටි ගොඩනැගිල්ල සහ සියල්ල ඇතුළත්ව,

ඉඩමේ ප්‍රමාණය : අක් 0 රූඩ් 0 පර්. 10.70 (වර්ග මීටර් 270.63)

පහත සඳහන් උකස්කරුවන්/බන්ධනදායීන් වන, ශ්‍රී ලංකා ජනරජයේ කොළඹ 11, පීපල්ස් පාර්ක් සාප්පු සංකීර්ණය, අංක 180/1/18 යන ස්ථානයේ, ව්‍යාපාර ලියාපදිංචි අංක W 44457 යටතේ ලියාපදිංචි වූ "වින්කෝ ඉම්පෙක්ස්" නම් හවුල් ව්‍යාපාරය පවත්වාගෙන යන, ශ්‍රී ලංකා ජනරජයේ කොළඹ 04, ලෙයාර්ඩ්ස් පාර, අංක 6 1/B යන ලිපිනයේ පදිංචි, ජාතික හැඳුනුම්පත් අංක 551571122 V දරන මාර්කන්ඩු කිරිදරන් මහතා සහ ජාතික හැඳුනුම්පත් අංක 587221632 V දරන කලාරෝහිණී කිරිදරන් මහත්මිය,

ශ්‍රී ලංකා ජනරජයේ කොළඹ 12, ඩැම් වීදිය, අංක 51 යන ස්ථානයේ, ව්‍යාපාර ලියාපදිංචි අංක W/A 40269 යටතේ ලියාපදිංචි වූ "විමාකෝ" නම් හවුල් ව්‍යාපාරය පවත්වාගෙන යන, ශ්‍රී ලංකා ජනරජයේ කොළඹ 04, ලෙයාර්ඩ්ස් පාර, අංක 6 1/ B යන ලිපිනයේ පදිංචි, ජාතික හැඳුනුම්පත් අංක 551571122 V දරන මාර්කන්ඩු කිරිදරන් මහතා සහ ජාතික හැඳුනුම්පත් අංක 587221632 V දරන කලාරෝහිණී කිරිදරන් මහත්මිය විසින් ප්‍රසිද්ධ නොතාරිස් ඩී. එම්. ස්වාමිනාදන් විසින් සහතික කරන ලද, 2008 මාර්තු මස 13 වන දිනැති අංක 7353 දරන උකස්කරය ප්‍රකාර, සීමාසහිත එම්සීබී බැංකුවට (කලින් සීමාසහිත මුස්ලිම් කොමර්ෂල් බැන්ක්) උකස් කරන ලදුව, ගෙවීම්වල දී පොරොන්දු නිසියාකාරව ඉෂ්ට නොකරන ලද දේපළ, සීමාසහිත එම් සී බී බැංකුව විසින් අප වෙත පවරන ලද බලය යටතේ අප විසින් 2011 පෙබරවාරි මස 25 වැනි දින (සිකුරාදා) පෙරවරු 11.00 ට පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*ගෙවීමේ ක්‍රමය*.- මිල තීන්දු වූ වහා ම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතු යः

1. ගැණුම් මිලෙන් 25% ක් (සියයට විසිපහක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2% (සියයට දෙකහාමර) ගැණුම් මිලෙන්,
4. රු. 42,000 ක් වන සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
5. ලිපිකරුගේ සහ සෝෂකගේ ගාස්තුව රු. 500,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 3,000,
7. ගැණුම් මිලෙන් 12% ක වැට් බදු.

ගැණුම් මිලෙන් 75% ක් වූ ඉතිරිය ද ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරුබදු, අය බදු හෝ ගාස්තු අයකිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත ගෙවිය යුතු වේ.

වැඩි විස්තර සඳහා කරුණාකර එම් සී බී බැංකුවේ නීති දෙපාර්තමේන්තුව අමතන්න : දුරකථන අංක 5222233

ෂොක්මන් සහ සමරවික්‍රම,
රජයේ අනුමැතිය ලත්, සියවසකට අධික
කලක් ශ්‍රී ලංකාවේ පිළිගත්, පුරෝගාමී
වරලත් වෙන්දේසිකරුවෝ, තක්සේරුකරුවෝ
සහ දේපළ ඒජන්තවරු.

*ප්‍රධාන කාර්යාලය :*
අංක 24 ටොරින්ටන් පාර,
මහනුවර,
දුරකථන 081-2227593
දුරකථන/ෆැක්ස් 081-2224371
ඊමේල් :schokmankandy@sltnet.lk

*නගර කාර්යාලය හා ප්‍රදර්ශනාගාරය:*
අංක 290, හැව්ලොක් පාර,
කොළඹ 05,
දුරකථන 011-2502680, 2585408
දුරකථන/ෆැක්ස් 011-2588176
ඊමේල් :schokman@samera 1892.com

වෙබ් අඩවිය :www.schokmanandsamerawickreme.com

02-81

---

## ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි

බස්නාහිර පළාතේ කොළඹ පිහිටි වානිජ මහාධිකරණයේ දී ය.

ද ස්ටෑන්ඩඩ් ක්‍රෙඩිට් ලංකා ලිමිටඩ්,
අංක 277, යූනියන් පෙදෙස, කොළඹ 02.

නඩු අංකය :
එච්සී/සිවිල්/
243/2007/
එම්ආර්

.........................*පැමිණිලිකරු*

එදිරිව

රාජපක්ෂ පතිරණගේ විමලසිරි,
අංක 156/1, ගල්ලොලුව, වැලිවේරිය

......................විත්තිකරු

ඉහත සඳහන් නඩුවේ මා වෙත නිකුත් වී ඇති විකිණීමේ නියෝගය අනුව ඉහත නම් සඳහන් විත්තිකරුගෙන් අයකරගන්නා ලෙස පැමිණිලිකරුට නියම කරන ලද රු. 32,23,160 ක මුදල සහ එම මුදල මත 2006.11.25 දින සිට තීන්දු ප්‍රකාශය දින දක්වා වසරකට 21% බැගින් වැඩිදුර පොලියක්ද මුලු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිමවන තෙක් තීන්දු ප්‍රකාශයේ දින සිට නෛතික පොලියක් විත්තිකරු විසින් පැමිණිලිකරුට ගෙවිය යුතු බවට ආඥා කොට ඇත. තවද මෙහි පහත උපලේඛනයේ සහ එම තීන්දු ප්‍රකාශයේ උපලේඛනයේ විස්තර කර ඇති ඉඩම සහ නිවස අයකර ගත යුතු සම්පූර්ණ මුදල අයකර ගැනීම සඳහා බැඳී ඇති බවටත් එය ඇස්කීසි කළ හැකි බවටත් වැඩිදුරටත් නියෝග කොට තීන්දු ප්‍රකාශ කොට ඇත.

එසේ හෙයින් ඉහත සඳහන් තීන්දු ප්‍රකාශයේ සඳහන් මුදල අයකර ගැනීම සඳහා මෙම නඩුවේ විත්තිකරු වන වැලිවේරිය, ගල්ලොලුව, අංකඃ 156/1 හි පදිංචි රාජපක්ෂ පතිරණගේ විමලසිරි යන අයට අයිති පහත උපලේඛනයේ විස්තර කරනු ලබන දේපල සහ එහි සියලු හිමිකම් සහ අයිතිවාසිකම් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා කටයුතු කරන ලෙසට කොළඹ වානිජ මහාධිකරණය විසින් මා වෙත නිකුත් කර ඇති විකිණීමේ නියෝගය යටතේ බලය ලබා දී ඇති බැවින් එකී දේපල, වර්ෂ 2011 ක් වූ පෙබරවාරි මස 25 වැනි දින පෙ.ව. 10.30 ට එකී දේපල පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

*ප්‍රවේශ මාර්ගය.-* මෙම දේපල පිහිටා ඇත්තේ මීරිගම - ගිරිඋල්ල මහා මාර්ගයේ ගිරිඋල්ල දෙසට යන විට 16 වැනි සැතපුම් කණුවට ආසන්නව දකුණට ඇති වාහන ගමනාගමනය සඳහා සුදුසු ටික දුරක් තාර දැමූ ඉතිරිය ගුරු පාර වන මාර්ගයේ කිලෝමීටර 1 1/2 ක් පමණ ගිය පසු නැවත දකුණට ඇති ගුරු පාරේ කිලෝමීටර් බාගයක් පමණ ගිය විට එහි වම් පසය.

*ගෙවීමේ ක්‍රමය.-* වෙන්දේසිය අවසන් වූ වහාම ගැණුම්කරු විසින් ගැණුම් මිලෙන් 25% ක මුදලක් එවෙලේම වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතු අතර ඉතිරි මුදල වන 75% දින 30 ක් ඇතුලත ඉහත සඳහන් නඩුවේ බැරට අධිකරණයේ තැන්පත් කළ යුතුය. ඒ සඳහා පිළිගත හැකි ඇපකරුවන් දෙදෙනෙකු ඉදිරිපත් කරමින් විකුණුම් කොන්දේසි අත්සන් තැබිය යුතුයි.

තවද ගැණුම්කරු විසින් වෙන්දේසිකරුගේ කොමිස් මුදල වන ගැණුම් මිලෙන් 2 1/2%, වෙන්දේසිය පැවැත්වීම සඳහා දරන ලද සියලුම වියදම්, තක්සේරු ගාස්තු 0.5% සහ පළාත් පාලන ආයතන ගාස්තු ගැණුම් මිලෙන් 1% ක් වෙන්දේසි අවසන් වූ අවස්ථාවේම වෙන්දේසිකරුට මුදලින් ගෙවිය යුතුය.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, හාපිටිගම් කෝරළේ උඩුගහ පත්තුවේ හරන්කහව ග්‍රාමයේ පිහිටි කෝන්ගහවත්ත (බලයලත් මිනින්දෝරු එච්. ඩී. ඩේ. වී. පෙරේරා මහතාගේ අංක 2212 සහ 1978.04.15 දිනැති පිඹුරේ අංක : බී 1 දරන බී. පී. එම්. ලීලාරත්න මහතාගේ අංක : 223/2004. සහ 2004.08.11 දිනැති පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද අංක : 1 දරන කැබැල්ලට මායිම් : උතුරට : මධුක වික්‍රමගේ යන අයිති ඉඩම ද, නැගෙනහිරට : ඩබ්ලිව්. සෝමාවතීගේ ඉඩම ද, දකුණට : ප්‍රාදේශීය සභා පාර සහ බස්නාහිරට : ප්‍රාදේශීය සභා පාර යන මායිම් තුල පිහිටි රූඩ් එකකුත් පර්චස් දොලහක් (අ. 0, රූ. 1, පර්. 12) ක් හෝ හෙක්ටයාර 0.1315 ක් විශාල ඉඩම සහ ඊට අයිති ගසකොල, පලතුරු, ගොඩනැගිලි ආදී සියලු දේද වේ. මෙය මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම පත්ඉරුව එෆ් 237/261 හි ලියාපදිංචි වී ඇත.

ඩබ්ලිව්. එම්. වික්‍රමරත්න,
බලයලත් වෙන්දේසිකරු/තක්සේරුකරු
සහ උසාවි කොමසාරිස්.

අංක 220/5, ගම්පහ පාර,
යක්කල.
දුරකථන අංක : 033-222568 සහ 071-8208360

*වැඩි විස්තර සඳහා :* ද ස්ටෑන්ඩඩ් ක්‍රෙඩිට් ලංකා ලිමිටඩ්,
අංක 277, යූනියන් පෙදෙස, කොළඹ 02 දුරකථන : 011-5370370.

02-126

### මහජන බැංකුව - ජාඇල ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ වෙන්දේසියේ විකුණුම් දැන්වීම

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, ඒකල පිහිටි සින්කෝ එස්ටේට් නමැති ඉඩමේ පර්චස් අට (අ. 0, රූ. 0, පර්. 8) ක් විශාල බිම් කොටස සහ අංග සම්පූර්ණ නොවූ නිවස මහජන බැංකුව විසින් අප වෙත පවරන ලද බලය යටතේ අප විසින් 2011.02.22 වැනි දින පෙ.ව. 11.00 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ දේපල පිහිටි ස්ථානයේදී විකුණනු ලැබේ.

*රජයේ ගැසට් පත්‍රයේ,* 2010.12.10 දිනද, ඩේලි නිවුස්, දිනමිණ, සහ තිනකරන් පුවත්පත්වල 2010.12.01 දිනද, පළකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපලට පිවිසීම.-* ජාඇල - ඒකල නගර මධ්‍යයේ සිට ඒකල දෙසට ඇති මාර්ගයේ කි. මීටර් 01 ක් පමණ යන විට හමුවන වමට ඇති රජ මාවත හෙවත් මයිකල් ප්‍රනාන්දු මාවතේ කිලෝමීටර් 01 ක් පමණ යන විට හමුවන බුද්ධ ප්‍රතිමාව අසලින් වමට ඇති මැල්වත්ත පාරේ මීටර් 50 ක් පමණ යන විට නැවත වමට හැරී මීටර් 250 ක් පමණ යන විට වම්පසින් නිලෙක්සිටි නිවාස සංකීර්ණය හමුවේ. එයට ඇතුළු වූ විට එහි වම් පසින් ඇති ලොට් අංක 12 දරන ඉඩම් කැබැල්ල සහ අංග සම්පූර්ණ නොවූ තනි මහල් නිවස සහිත මෙම දේපල හමුවේ.

*ගෙවීමේ ක්‍රමය.-* වෙන්දේසිය අවසානයේ, සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය.

1. ගැණුම් මිලෙන් 10% ක්,
2. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට 1% ක්,
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2% ක් ,
4. ලිපිකරු සහ නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 500 ක්,
5. විකුණුම් වියදම් සමග වෙනත් ගාස්තු වෙතොත් එම මුදල,
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු.

ගැණුම් මිලෙන් ඉතිරි 90% ක් වූ මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුලත ප්‍රාදේශීය කළමනාකරු මහජන බැංකුව, ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය, අංක 131, නුවර පාර, බැලුම්මහර, මුදුන්ගොඩ වෙත ගෙවිය යුතුය.

ඉහත සඳහන් කරන ලද පරිදි සඳහන් කළ මුදල් දින 30ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මුදලින් 10% ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු සහ වෙනත් අදාල විස්තර පහත සඳහන් ලිපිනයෙන් ලබාගත හැක. ප්‍රාදේශීය කළමනාකාර, මහජන බැංකුව, ගම්පහ ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය, අංක 131, නුවර පාර, බැලුම්මහර, මුදුන්ගොඩ.

දුරකථන අංක : 033-2222325, 033-2225008, 033-2231901
ෆැක්ස් අංක : 033-2226165, 033-2226741

ෂොක්මන් සහ සමරවික්‍රම
රජයේ අනුමැතිය ලත්, සියවසකට අධික
කලක් ශ්‍රී ලංකාවේ පිළිගත්, පුරෝගාමී
වරලත් වෙන්දේසිකරුවෝ, තක්සේරුකරුවෝ
සහ දේපළ ඒජන්තවරු.

*ප්‍රධාන කාර්යාලය :*
අංක 24 ටොරින්ටන් පාර, මහනුවර,
දුරකථන අංක : 081-2227593
දුරකථන/ෆැක්ස් : 081-2224371
ඊමේල් : schokmankandy@sltnet.lk

නගර කාර්යාලය සහ ප්‍රදර්ශනාගාරය :
අංක 290, හැව්ලොක් පාර, කොළඹ 05,
දුරකථන අංක : 011-2502680, 2585408
දුරකථන/ෆැක්ස් අංකය : 011-2588176
ඊමේල් :schokman@samera1892.com

වෙබ් අඩවිය :www.schokmanandsamerawickreme.com

02-82

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන

## සංශෝධිත ගාස්තු

2009 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රීම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2009 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | | රු. ශ. |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව | ... ... ... ... | 137 00 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට | ... ... ... | 137 00 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට | ... ... ... | 1,300 00 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට | ... ... ... | 2,600 00 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ ගැසට් පත්‍රයේ සෑම කොටසක ම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. **2009 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

*** ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)**

| | *වාර්ෂික දායක මුදල* | *තැපැල් ගාස්තුව* |
|---|---|---|
| | *රු. ශ.* | *රු. ශ.* |
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 2,080 00 | 3,120 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 1,300 00 | 3,120 00 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 780 00 | 3,120 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 4,160 00 | 6,240 00 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 580 00 | 3,120 00 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 405 00 | 3,120 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 890 00 | 2,400 00 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 860 00 | 420 00 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 260 00 | 180 00 |
| අති විශෙෂ ගැසට් පත්‍රය... ... ... ... ... ... ... | 5,145 00 | 5,520 00 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

*** තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)**

| | **පිටපතක මිළ** | **තැපැල් ගාස්තුව** |
|---|---|---|
| I වැනි කොටස : | *රු. ශ.* | *රු. ශ.* |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 00 | 60 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 00 | 60 00 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 00 | 60 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 00 | 120 00 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 00 | 60 00 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 123 00 | 60 00 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 87 00 | 60 00 |

* කොළඹ 05, කිරුළපන, මායා මාවතේ, අංක 132 හි ප්‍රකාශන කාර්යංශයේ තනිපිටපත් විකිණීම සහ දායක මුදල් භාර ගැනීමේ අධිකාරී වෙත මුදල් ලැබෙන්නට සළස්වන්න.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙනන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. *ඊළඟ ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවාත් හැර එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා රජයේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියලු ම දායක මුදල් කොළඹ 05, කිරුළපන, මායා මාවතේ අංක 132 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

***සැළකිය යුතුයි.*** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත නොව රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

**උපලේඛනය**

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | **2011** | | | | | |
| පෙබරවාරි | 2011.02.03 | බ්‍රහස්පතින්දා | 2011.01.21 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2011.02.11 | සිකුරාදා | 2011.01.28 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2011.02.18 | සිකුරාදා | 2011.02.03 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2011.02.25 | සිකුරාදා | 2011.02.11 | සිකුරාදා | දහවල් | 12.00 |
| මාර්තු | 2011.03.04 | සිකුරාදා | 2011.02.18 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2011.03.11 | සිකුරාදා | 2011.02.25 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2011.03.18 | සිකුරාදා | 2011.03.04 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2011.03.25 | සිකුරාදා | 2011.03.11 | සිකුරාදා | දහවල් | 12.00 |
| අප්‍රේල් | 2011.04.01 | සිකුරාදා | 2011.03.18 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2011.04.08 | සිකුරාදා | 2011.03.25 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2011.04.15 | සිකුරාදා | 2011.04.01 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2011.04.21 | බ්‍රහස්පතින්දා | 2011.04.08 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2011.04.29 | සිකුරාදා | 2011.04.15 | සිකුරාදා | දහවල් | 12.00 |

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2011 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.